# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,960 — 1933ක්වූ ජනවාරි මස 6 වෙනි දිනවූ සිකුරාදා.


## Part IV. — හතරවෙනි කාණ්ඩය.

---

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම්.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3 හේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පාරක්සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහාක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට, උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

නොම්මර 350 දරණ අවසාන සිතියමේ උප්පටාගන්නාලද අඩුමෙවෙනි කොටස. ගම—වයඹ දිසාවේ කුරුණෑගල දිස්ත්‍රික්කුවේ කට්ටුගම්පලහත්පත්තුවේ මැදපත්තු හැගෙණහිරකෝරළේ ගොරකොල්ලවෙගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 50ඒ | පුන්චිවැරදියාගේවත්ත | පොල්වත්ත .. | ඇස්. කෝනේලිස් සිල්වා, කටාන .. | .. 1 1 22·6 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝනොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ පෙබරවාරි මස 14 වෙනි දින පෙරවරු 11 හේ කනිසමට ගිරිඋල්ලේ තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටිනා මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ දෙසැම්බර් මස 23 වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

සී. හැරිසන් ජෝන්ස්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වර්ෂ.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3 හේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—රඹුක්කන බාල්දි තබන වැසිකිළියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 110. ගම—මොට්ටප්පුලිය (රඹුක්කන සනීපාරක්ෂක සභාවේ මායිම්තුළ).

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1AS | නොතාරිස්වත්ත හෝනොහොත් තිබ්බටුගොල්ලේ වත්ත (වරිපනම් නො. 210) | අවුරුදු 30ක් පමණ වයසැති පොල්ගස් තුනක්ද, අලුත සෑදූ සින්ක් වැසිකිළි දෙකක් සහ ගලින් බැඳිවලක්ද ඇති පොල්ඉඩම | ඇල්. එච්. සමරක්කොඩි අද්ව කාත් මහතා | 0 0 10·6 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම හෝනොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1933ක්වූ පෙබරවාරි මස 7 වෙනි දින පෙරවරු 10 (දහයේ) කනිසමට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමින ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ දෙසැම්බර් මස 20 වෙනි දින කෑගල්ලේ කච්චේරියේදීය,

ජ. එච්. ලූසැව්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්ෂ.


1——J. N. 25985—122 (12/32)

S 1

## ඉඩම් නිරවුල්කිරීම සම්බන්ධ ප්‍රාරම්භ දැන්වීම්.

### 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපනතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 262. (මහනුවර).

මීට යාකර තිබෙන උප ලේඛනයේ විස්තරවන ඉඩමෙන් හෝ ඒ ඉඩමේ යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1933ක්වූ ජනවාරි මස 6වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජයන්තක ඉඩම්කැයි 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලද බවද රජයන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1932ක්වූ දෙසැම්බර් මස 9වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. සී. ගෝඩ්සෝල්,
මහනුවර උප ඒජන්ත උන්නාන්සේ වෙනුව.

(*a*) මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, එහි සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම උඩින් යන පාරකට අයිතිකම්කිමක් ඉඩමට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

#### උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ යටිනුවර කොට්ඨාසයේ බැදපලාතකෝරලේ උඩවෙල යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන බිම්කැබැල්ල එනම් :—

උතුරට : කිරිබසියා මිදුණෙන් අයිතිකම්කියන රන්දුන්පුර ගෙදරවත්ත.

නැගෙණහිරට : ආණ්ඩුව විසින් තීන්දුකර තිබෙන කැබෑරුමේවත්ත නොහොත් මාවියන්ගොඩවත්ත (P. P. 8593/2) ආර්. සේතුවා අයිතිකම්කියන මැදගෙදරවත්ත, ඒ. කළුවා සහ තවත් අය අයිතිකම්කියන රන්දුනුපුරගෙදරවත්ත.

දකුණට : නොම්බර 53,773 දරණ පිඹුරුකඩදාසිය පිට උරුම්කියන ඉඩම.

බස්නාහිරට : ආණ්ඩුව අයිතිකම්කියන මාවියන්ගොඩහේන (P. P. 8184/1).

#### මුල් සිතියමේ නො. 8,593

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | කැබෑරුමේවත්ත නොහොත් මාවියන්ගොඩ වත්ත .. .. | 0 3 5 |

### 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 263. (මහනුවර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවන ඉඩමෙන් හෝ ඒ ඉඩමේ යම් කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1933ක්වූ ජනවාරි මස 6වෙනි දින පටන් තුන්මාසයක් ඇතුලත මෙහි පහත අත්සන්කරන මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම රජයන්තක ඉඩමකැයි 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනු ලබන බවද රජයන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතු කරන බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1932ක්වූ දෙසැම්බර් මස 6වෙනි දින මහනුවර කච්චේරියේදීය.

ඩබ්ලිව්. සී. ගෝඩ්සෝල්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ වෙනුව.

(*a*) මෙම ඉඩම ගැන වැඩිදුර තොරතුරු, මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, එහි සිතියම සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම උඩින් යන යම් පාරකට අයිතිකම් කීම ඒ ඉඩමට අයිතිකම් කීම හැටියට භාරගනු ලැබේ.

#### උප ලේඛනය.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ යටිනුවර කොට්ඨාසයේ ගඟපලාතකෝරලේ දෙහිගම පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන බිම්කැබැල්ල, එනම් :—

උතුරට : එච්. ඇම්. පුන්චිරාල අයිතිකම්කියන අඹගස් කැන්න.

නැගෙණහිරට : සෙලේමා ලෙබ්බේ අයිතිකම්කියන අඹගස්තැන්න.

දකුණට : ගුරුගම සිට මුරුත්තලාවට යන පාර.

බස්නාහිරට : ඇස්. පීටර් අයිතිකම්කියන බෝයගොඩහේන.

#### මුල් සිතියමේ නො. 4,782.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 12882 | බෝයගොඩහේන .. | 1 3 15 |

### 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතයි.

### නිරවුල්කිරීමේ දැන්වීම නො. 264 (මහනුවර).

මීට යාකර තිබෙන උප ලේඛනයෙහි විස්තරවෙන ඉඩම්වලින් කිසිවක් හෝ ඒ ඉඩම්වල යම්කිසි කොටසක් නොහොත් ප්‍රයෝජනයක් ගැන යම් කෙනෙකුට යම් අයිතිවාසිකමක් ඇත්නම් එය වර්ෂ 1933ක්වූ ජනවාරි මස 6වෙනි දින පටන් තුන්මාසයක් ඇතුළත මෙහි පහත අත්සන්කරණ මා වෙත ඉදිරිපත් නොකළොත් එකී ඉඩම් රජයන්තක ඉඩමකැයි 1931යේ ඉඩම් නිරවුල්කිරීමේ ආඥාපණතේ 5 (1) වන වගන්තිය යටතේ ප්‍රකාශකරනුලබන බවද රජයන්තක ඉඩමක් වශයෙන් ගෙන ඒව කටයුතුකරණ බවද එකී ආඥාපණතේ 4වන වගන්තිය යටතේ මෙයින් දැනුම්දෙනු ලැබේ.

වර්ෂ 1932ක්වූ දෙසැම්බර් මස 6වෙනි දින මහනුවර කච්චේරියේ දීය.

ඩබ්ලිව්. සී. ගෝඩ්සෝල්,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්ත උන්නාන්සේ වෙනුව.

(*a*) මෙම ඉඩම්ගැන වැඩිදුර තොරතුරු මධ්‍යම දිසාවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

(*b*) මෙකී ඉඩම්වලට නොහොත් එයින් එකකවත් උඩින් යන යම් පාරකට අයිතිකම්කීම, ඒ ඉඩමට නොහොත් ඉඩම්වලට අයිතිකම් කීම හැටියට බාරගනු ලැබේ.

#### උපලේඛනය.

මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ උඩපලාත කොට්ඨාසයේ කඩුකර පහලකෝරලේ ඉඟුරුවත්ත යන ගමේ පිහිටා තිබෙන මෙහි පහත සඳහන් මායිම්වලට මැදිවූ පහත දක්වන සියළුම බිම්කට්ටි, එනම් :—

උතුරට : කාසල්මිල්ක්වත්තේ චාර්ල්ස්ලී මහතා සහ පුංචි අයිඳු මුදලාලි විසින් උරුම්කියන ඇල්ලමුල්ලදෙනියේවත්ත (P. P. 5,148/1,857), චාර්ල්ස් ද සිල්වා මහතා විසින් උරුම කියන පුස්සේතැන්නවත්ත සහ නොම්බර 182,585 සහ 182,583 දරණ පිඹුරුකඩදාසි පිට උරුම්කියන ඉඩම්.

නැගෙනහිරට : ලැගුම්දෙනිය ගමේ ගම් මායිම.

දකුණට : කහවත්ත ගමේ මායිම.

බස්නාහිරට : මැක්වුඩ් සමාගම විසින් උරුම්කියන ඔරුසන් වත්ත (P. P. 5,148/H 857).

#### මුල් සිතියමේ නො. 8,790.

| බිම්කට්ටිය. | ඉඩමේ නම. | බිම්තරම, අ. රූ. ප. |
|---|---|---|
| 1 | හෙල්ලිගොල්ලේහින්න නොහොත් එලමල් දෙනියේහින්න .. .. | 1 2 21 |
| 2 | එම .. .. | 1 0 21 |
| | | 2 3 2 |

## වැන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර සම්බන්ධ දැන්වීම.

බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් වර්ෂ 1933ක්වූ ජනවාරි මස 17වෙනි අඟහරුවාදා උදේ 11ට කොළඹ කච්චේරියේදී මීට යාකර තිබෙන ලැයිස්තුවේ සඳහන් වන ආණ්ඩුවේ ඉඩම් කට්ටිවල තණකොළ සහ එලවළු වැවීමට 1933ක්වූ ජනවාරි මස 17වෙනි දින පටන් අවුරුදු 5කට බද්දට දීමට මෙහි සඳහන්කරණ කොන්දේසිවලට යටත්ව වැන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

1. බදුමිල අවුරුද්දපතා අවුරුද්ද මුලදී ගෙවන්ට ඕනෑය.

2. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගහක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ට අවසර නැත.

3. බදු ඉඩමේ වැට බඳින්ට ඒජන්ත උන්නාන්සේ විසින් නියමකළොත් එසේ කිරීමට බදුකාරයා බැඳීලාය.

4. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලබාගත් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩම යම් කෙනෙකුට පවරන්ටවත් නැවත බදුදෙන්ටවත් ගැනුම්කාරයාට අවසර නැත.

5. තණකොළ කන්ට ඉඩමේ ඇරීන සැම හරක්ම ප්‍රසිද්ධ පාරවල්වල දඩාමන් නොයනකාර දිගලීකර තිබන්ට ඕනෑය.

6. කිරිඑලදෙනුන්ට හෝ මීදෙනුන්ට තණකෑමට අවසර දියයුතු නොවේ. එසේ තණකෑමට ඉඩහරිනුලැබූ සතුන් ඇල්ලීමට බදුදීම්කාරයාට හෝ එතුමාගෙන් කිසි බලයලත් අයෙකුට අවසර තිබේ.

7. ගැනුම්කාරයා විසින් ඉඩම සුද්දෙන් සහ හොඳකාරයෙන් තබාගන්ටත් නාගරික සභාවේ අණපණත් හැටියට ක්‍රියාකරන්ටත් වරීපනම් ගෙවන්ටත් ඕනෑය.

8. බදු ඉඩමෙන් බොරළු, වැලි ආදියක් විකුණන්ටවත් ගෙනයන්ටවත් ගැනුම්කාරයාට තහනම්ය. තවද එම ඉඩමට අලාභහානිවෙන කිසි ක්‍රියාවක් කිරීමත් තහනම්ය.

9. මුළු ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑ කලොත් මාසයක් කල්දුන්හිට එවැනි ඉඩම හෝ ඉඩම් කොටස ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ ආණ්ඩුව විසින් නැවත භාරගන්නා ඉඩම් කොටසට ගතවෙන්ට තිබෙන බද්දෙන් ඒ ප්‍රමාණයට ඉදිරියට ගතවෙන්ට තිබෙන කාලයට බදු මුදලෙන් ආපසු ගෙවන්ට යෙදෙනවා ඇත.

10. ඒජන්ත උන්නාන්සේගේ විශේෂ අවසරයක් නැතුව ඉඩම්වල මඩුකුඩම් සෑදීම තහනම්.

11. ඉහත සඳහන්වෙන කොන්දේසි කඩකලොත් වන්දි මුදලක් නොගෙවා ගැනුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අහක්කර ඉඩම් නැවත භුක්තියට පැමිණෙන්ට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

12. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ටත් ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

ආර්. ඇෆ්. ඇම්. වර්ස්ලි,
බස්නාහිර දිසාවේ වැඩබලන ආණ්ඩුවේ
ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1933ක්වූ ජනවාරි මස 4වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

ඉඩම්වල විස්තර.

| කඩදාසි නොම්මරය. | ඉඩමේ නම. | ප්‍රමාණය. අ. | රූ. | ප. | පිහිටීම. |
|---|---|---|---|---|---|
| L. H. 1222 | මුල් සිතියමේ නො. 17,990වේ නො. 2 බිම්කැබිලිය | 0 | 3 | 1·8 | වැලිකඩ |
| L. H. 1223 | කොළඹ කුරුඳුවත්තේ බදු සිතියමේ නො. 10යේ බිම් කැබිලිය | 1 | 0 | 6 | එම |